මහා සභාව
**2021-12-09**

## වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2021 වර්ෂයේ / 46 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව - කෙටුම්පතකි.

### 2021.12.09

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
14. ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
16. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17. ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
18. ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
20. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
21. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
22. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
23. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
24. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
25. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
26. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
27. ගරු මන්ත්‍රී එම්.ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
28. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
29. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
30. ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
31. ගරු මන්ත්‍රීනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
32. ගරු මන්ත්‍රීනී එම්.එම්.මේරි.චාලට් කුරේ මහත්මිය

33. ගරු මන්ත්‍රීනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
34. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
35. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
36. ගරු මන්ත්‍රීනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
37. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
38. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
39. ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
40. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

ඉන් පසුව වයඹ ආණ්ඩුකාරවර අධිනීතීඥ රාජා කොල්ලුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී.

## 01.2021.11.11 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

**තීරණ අංක 01**

**2021.11.11 වන දින පැවති මහා සභා රැස්වීම් සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

ගරු මන්ත්‍රී ටි.බි.ඩි. ඇන්ටනි කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම රැස්වීම් වාර්තාව සම්මත කිරීමෙන් පසුව සාකච්ඡා කලයුතු කාරණාවක් තිබෙන බවත්, පසුගිය වාර්තාව දින දෙකක් තිබියදී තමාට ලැබුණු බවත්, මෙම සභා වාර්තාව පසුගිය සඳුදා දින දහවල් 12ට ලැබුණු බවත්, වාර්තාව කියවා ගැනීමටවත් කාලයක් නොමැති වූ බවත් ප්‍රකාශ කරන ලදී.

අනිවාර්යෙන්ම අදාල දිනට එය ගරු මන්ත්‍රීවරුන්ට ලැබීමට සලස්වන ලෙසට ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට දැනුම් දෙන ලදී. වර්ෂාව හේතුවෙන් ප්‍රමාද වී ඇති බවත් එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් ලඟම සිටින මන්ත්‍රීවරයෙකු බවත් මෙය දිගින් දිගටම සිදු වූ සිදු වීමක් බවත් වර්ෂාව යැයි පැවසීමට නොහැකි බවත් ගරු මන්ත්‍රී ටි.බි.ඩි. ඇන්ටනි කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

වාර්තාව බෙදන සේවක මහතාට පහසුවක් වීම සඳහා එදින සවස කර්මාන්ත කමිටුව අවසන් වී එම කමිටුවට සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන් එම වාර්තා රැගෙන ගිය බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරව අධි නීතීඥ රාජා කොල්ලුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක පණිඩ්ඩයක් නිකුත් කිරීමට ගරු සභාපති තුමා විසින් අවස්ථාව ලබා දෙන ලදී.

- ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නිර්දේශය මත වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂයේ ප්‍රධාන ලේකම් රාජා කොල්ලුරේ මැතිතුමාණන් පසුගිය දින අභාවප්‍රාප්ත විමට යෙදුන බව ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම ගරු රාජා කොල්ලුරේ අධි නීතීඥතුමා එතුමාගේ දේශපාලන කාලසීමාව තුළ වාමාංශික ව්‍යාපාරයට ශක්තියක් වූ එතුමාගේ ජේෂ්ඨ නායකයන් වූ ආචාර්යය කොල්වින් ආර් ද සිල්වා මැතිතුමා, පීටර් කෙනමන් මැතිතුමා, එස්.ඒ.වික්‍රමසිංහ මැතිතුමන්ගේ ආභාශය ලද පුරවැසියෙකු ලෙස ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කළ බවද ප්‍රකාශ කරන ලදී. එතුමා ඉතාමත් නිහතමානී චරිතයක් බවත්, එතුමාගේ දේශපාලන ගමන් මඟ ආ කාලසීමාව තුළ එතුමා තම පක්ෂයට, ශ්‍රී ලංකාවේ දේශපාලන අභිවෘද්ධියට මෙන්ම එතුමා දැරූ සියළුම තනතුරු වලදී එතුමා ඉතාමත් නිහතමානී සේවාවක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. අපට සහ සම්බන්ධ වන වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා ලෙස වයඹ පළාත් සභාවේ කාලසීමාව තුළදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

කෙරෙහි විශේෂ ඇල්මක්, විශේෂ කැමැත්තක් දැක් වූ බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා ලිපි ලේඛනයක් ගෙන එතුමා වෙත ගිය විට එතුමා නිහතමානීව ගරු සභාපතිතුමාව පිළිගත් බව තමන් සම්බන්ධ වූ කටයුතු වලදී දුටු බවත්, වෙන්නප්පුව යැයි පැවසූ විට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගරු සභාපති තුමාගේ ඥාතිවරයා යැයි සිහිකර, එතුමා ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාට ද ඉතාමත් ප්‍රසාධයක් දැක්වූ බවත් ප්‍රකාශ කරන ලදී. එම සුසංයෝගය තුළ ගරු සභාපතිතුමාට අප සභාවේ කළමනාකාරිත්වය සිදු කිරීමට හා එම පරිපාලන කටයුතු සිදු කිරිමට ගරු ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා විශාල අනුග්‍රහයක් හා ශක්තියක් වූ බවත් ප්‍රකාශ කරන ලදී. එම සේවයේ යෙදී සිටියදීම එතුමා හදිසියේ රෝගාතුර වූ බවත් එම අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන්නද එතුමා මිය පරලොව ගිය බව පෙරේදා අළුයම දැනගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. අපට හිතෛශීත්වයක් දැක්වූ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමාගේ අභාවය පිළිබඳව ද ගෞරවනීය වූ ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. එතුමාගේ සේවය අප ඉතාමත් අගය කරන බව පවසා එම යෝජනාව සභාගත කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්. ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා පිළිබඳව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පැවසූ දෙය සත්‍ය බව ප්‍රකාශ කරන ලදී.

තමන්ද එතුමාව ආශ්‍රය කර ඇති බවත්, ඉතාමත් හොඳ හදවතක් තිබෙන හොඳ සවන්දෙන්නෙක් මෙන්ම ජනතාවගේ අවශ්‍යතාව හඳුනාගත් හොඳ නායකයෙකු බවත්, එතුමා ජේෂ්ඨ අධි නීතිඥයකු බවත්, එතුමා කොමියුනිට්ස් පක්ෂයේ මහ ලේකම් ලෙස කටයුතු කළ බවත් පසුගිය දින එතුමාට පක්ෂයෙන් ද ගැටළුවක් මතු වී නඩුවක්ද පවතින බවත්, ඒ සඳහා සටන් කරමින් සිටියදී එතුමා හදිසියේ අභාවප්‍රාප්ත වූ බවත් ප්‍රකාශ කරන ලදී.

මෑතකදී ද CAT -2020 උත්සවයේදීද එතුමාව අවසාන වතාවට හමු වූ බවත්, එතුමා වෙන්නප්පුව පිළිබඳව ඉතාමත් ආදරයක් දැක්වූ බවත්, වයඹ පළාතට සුදුසු හසළ අත්දැකීම්ද තිබූ නායකයෙකු අපට අහිමි වූ බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් එතුමාගේ පවුලේ සියළු දෙනාටම අපගේ ශෝකය ප්‍රකාශ කරන ලෙසද පවසමින් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

- වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමා අපට හිතෛශීව, අප සභාවට ඉතාමත් ඇල්මකින් කටයුතු කළ නායකයෙකු බවත් යම් කටයුත්තක් සිදු කිරීමට තිබුණහොත් එය නොපිරිහෙලා ඉටු කළ ආණ්ඩුකාරවරයෙකු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. තමන් එතුමාට ඉතාමත් ගරු කරන බවත්, Online පද්ධතිය මුළු ලංකාවෙන්ම පළමුවෙන්ම සිදු කිරීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ලැබීම පිළිබඳව එතුමා ඉතාමත් සතුටු වූ බවත්, එම උත්සවය අවස්ථාවේ එතුමා මෙම Online පද්ධතියේ වැදගත්කම පිළිබඳව විනාඩි 15 ක පමණ කතාවක් එතුමාගේ අත්දැකීම් ද සමඟ සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදී. එවැනි අත්දැකීම් බහුල පුද්ගලයෙකු බවත්, එතුමාට ලිපියක් දුන් විට අකුරක් නැර එතුමා කියවූ බවත් එතුමාගෙන් බොහෝ දෑ ඉගෙනගත් බවත්, සභාපතිවරු 33 දෙනෙකු අතරින් තමන්ට සුවිශේෂී තැනක් එතුමා ලබා දුන් බවත්, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා සමඟ තිබූ හිතවත්කම නිසා එසේ සිදුවන්නට ඇතැයිද ප්‍රකාශ කරන ලදී. එතුමාගේ අභාවය තමන් අතිශය කම්පනයට පත් වූ දිනයක් වූ බවත් ප්‍රකාශ කරන ලදී. අප සභාවේ ශෝක පණිවිඩය එතුමාගේ බිරිඳට ලැබීමට සලස්වමුයැයි ද ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 02

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර අධි නීතිඥ රාජා කොල්ලුරේ මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ඥාතීන් වෙත ශෝක පණිවිඩයක් යැවීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්..ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් සභා සම්මත විය. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

02. අද දින ගරු මහා සභාවට පැමිණි නව මන්ත්‍රීතුමා වන ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතාව මහා සභාව වෙත ගරු සභාපතිතුමා විසින් ගෞරවයෙන් පිලිගන්නා ලදී.

## 03. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

ගරු සභාපතිතුමා ඉදිරිපත් කල අදදින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවිර මහත්මිය
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

කොවිඩ්-19 තෙවන මාත්‍රාවද ලබාදෙමින් සිටින බැවින් සියළුම සාමාජිකයින්ව කමිටු සඳහා සහභාගී කරවා ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් කමිටු ගරු සභාපතිවරුන්ට දැනුම් දෙන ලදී.

තීරණ අංක 04

2021 නොවැම්බර් මස පහත සඳහන් **කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

| **2021 නොවැම්බර් මස 05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** | |
|---|---|
| අ/අ | නම |
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **4.** | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |

| | |
|---|---|
| 6. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2021 නොවැම්බර් මස 12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2021 නොවැම්බර් මස 24 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2021 නොවැම්බර් මස 26 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2021 නොවැම්බර් මස 30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| | |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය |

**2021 නොවැම්බර් මස 05 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව**

| | |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |

| | |
|---|---|
| **7.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| **8.** | ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| **2021 නොවැම්බර් මස 01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව** | |
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |
| **2021 නොවැම්බර් මස 25 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව** | |
| **1.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **2.** | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **5.** | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |
| **6.** | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| **2021 නොවැම්බර් මස 03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව** | |
| **1.** | ගරු මන්ත්රී එල්.කේ .ජගත් ප්රියංකර මහතා |
| **2.** | ගරු මන්ත්රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා |
| **3.** | ගරු මන්ත්රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්රී එම්. ප්රියාල් බ්රයන්ත පෙරේරා මහතා |
| **6.** | ගරු මන්ත්රිනි ආර්.පි. නදීකා රණවිර මහත්මිය |

04. වෙන්නප්පුව මහජන පුස්තකාලයේ දැනට පවතින මෘදුකාංග පද්ධතිය ඉවත් කර කොහා මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 05

වෙන්නප්පුව මහජන පුස්තකාලයේ දැනට පවතින මෘදුකාංග පද්ධතිය ඉවත් කර කොහා මෘදුකාංග පද්ධතිය කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

05. පුද්ගල නාමවලින් මාර්ග නම් කිරීම සඳහා සුදුසු නිර්ණායක සකස් කර මින් ඉදිරියට කටයුතු කරන ලෙසට නයිනමඩම ග්‍රාමයේ ගම් වැසියෙකු විසින් පියතුමාටද පිටපත් යවමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී මහජනතාව මෙය දකිනුයේ සමාජ විරෝධී ක්‍රියාවක් ලෙසයැයිද ප්‍රකාශ කරන ලදී. ඉදිරියේදී මාර්ග නම් කිරීමේදී ආගමික නාමයක් භාවිතා

කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදි. සමාජයට කල මෙහෙවර වෙනුවෙන් යම් අයෙකුගේ නමින් මාර්ග නම් කරන්නේ නම් ඒ පිළිබඳව නැවත වරක් සිතා කොට්ඨාස මන්ත්‍රීවරයාවද දැනුවත් කර සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී. මෙය මේ වන විට විශාල ආන්දෝලනාත්මක සිදු වීමක් ලෙස සිදු වී ඇති බවත් විශාල පීඩනයක් බවට පත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.
එක්ලක්ෂ හැටදහසක් පමණ ජනතාව අතරින් ගරු මන්ත්‍රීවරුන් 44 දෙනෙකුට පමණක් මෙහි අසුන් ගැනීමට හැකි වී ඇති බවත්, එබැවින් ප්‍රශ්න වලදී උපේක්ෂාවෙන් ඒ දෙය බලමුයැයිද, සිත් වල ඇති දේ නිසා රටක් ලෙස එක් මට්ටමකට පැමිණීමට අද නොහැකි වී ඇති බවත් නිදහස ලබා වසර ගණනාවක් ගත වූවද මෙම බෙදීම තවමත් සිත් වලින් තුරන් කර ගැනීමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මෙම මාර්ග නම් කිරීමේදීද එලෙසම දෙපසට බෙදී සිටින බවත්, තමන් දන්නා ගැටළු සහගත මාර්ග නම් කිරීම් තිබෙන බැවින් එවැනි මාර්ග සඳහා පැරණි නමම භාවිතා කරන ලෙසටද ප්‍රකාශ කරන ලදී.

මෙම ඉදිරිපත් කරන තිබෙන ලිපිය සම්බන්ධයෙන් අදාල කොට්ඨාසභාර මන්ත්‍රීතුමා වන ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා විමසා සිටි අතර එහි පුද්ගල නාම සඳහන් වන බැවින් එය සභාගත නොකරන බවත්, මෙය ආදර්ශයට ගෙන මෙම පණිවිඩය ගරු සභාවට තමන් ලබා දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**06.** **පලාත් පාලන ආයතන තුළ කමිටු ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා 2022 වර්ෂයේ සිට ළමා හා කාන්තා කමිටුවක් පිහිටුවීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම කමිටුව ජනවාරි මස සිට ස්ථාපිත කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.සිරිගම්පල ජනපදය ආසියාවේ තිබෙන විශාලම ජනපදය බැවින් මෙම කමිටුවේ සභාපතිවරිය ලෙස** ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී. එමෙන්ම මෙහිදි ජ්‍යේෂ්ඨත්වය පිළිබඳව සලකා නොබැලූ බවත් ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය කාර්යබහුල බවත් තවදුරටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 06** |
| **පලාත් පාලන ආයතන තුළ කමිටු ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා 2022 වර්ෂයේ ජනවාරි මස සිට ළමා හා කාන්තා කමිටුවක් පිහිටුවීම සඳහා පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යංශය මඟින් එවා ඇති ලිපිය සාකච්ඡා කරන ලදී. මෙහිදී 2022 වර්ෂයේ සිට ළමා හා කාන්තා කමිටුවක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සභාපතිත්වයෙන් පිහිටුවීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

07. දැනට පවතින කාරක සභා ඉදිරි වර්ෂයටද පවත්වාගෙන යමුයැයිද, ගැටළු තිබේ නම් කමිටුව අවස්ථාවේ සාකච්ඡා කර විසඳා ගන්නා ලෙසත්, සියළුම දෙනා කාරක සභා සඳහා උනන්දුවෙන් සහභාගී වන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07 |
| **දැනට පවත්නා කමිටු 2022 වර්ෂය සඳහාද එලෙසම පවත්වාගෙන යාම සුදුසු බවටත්, සාමාජිකත්ව වෙනසක් සිදු වේ නම් ඊළඟ ගරු මහා සභාවට එය යොමු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

08. වයික්කාල ශා.සේවියර් දෙව්මැදුරේ මාර්ගය සකස් කර ඇති බවත් එය කර්මාන්ත කමිටුවට යොමු කල බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා කමිටු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජිකයින්ට දැනුම් දෙන ලදී.

09. ගරු මන්ත්‍රිනී.ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය පසුගිය දිනක විවාහ වූ බවත්, එතුමියට ඉදිරි දිවි ගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායැයි ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීමණ්ඩලය ප්‍රාර්ථනා කරන ලදී.

10. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අප සභාවට ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් නවක නීතිඥවරියක් පත් වීඇති බවත්, නීතිඥවරියක් ලෙස ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය පසුගිය දිනක දිවුරුම් දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාවට මේ වන විට මන්ත්‍රීමණ්ඩලයෙන් නීතිඥවරුන් පස්දෙනෙකු සිටින බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරුන් ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවියට සුභ පැතුම් එක් කල අතර එතුමියගේ ඉදිරි කටයුතු සාර්ථක වේවායැයිද ප්‍රාර්ථනා කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙය විශේෂ අවස්ථාවක් බවත්, ඇත්තෙන්ම අප සභාවට උගත් කාන්තාවක් ලැබීම පිළිබඳව අප සියළුම දෙනා සතුටු වියයුතු බවත් ප්‍රකාශ කරන ලදී.කාන්තාවන් පිරිමින් අභිබවා යන බවත්, නීතිඥවරුන් පස්දෙනා අතරින් තිදෙනෙකුම කාන්තාවන් බවත් ප්‍රකාශ කරන ලදී. අළුතින් දිව්රුම්දුන් ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවියට සුභාශිංසනය පුද කනර බවත් ලැබුවාවූ නව පදවිය තුළ සමාජයට මෙහෙවරක් සිදු කිරීමට සිතට ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.ස්වභාවධර්මය සමඟ මිනිසා නොසිටින නිසා මෙලෙස සිදු වී ඇති බවත්, මුදලට බර වූ සමාජයක් අද තිබෙන බවත්, එබැවින් ලැබුවාවූ නව වෘත්තීමය පදවිය තුළ සාධාරණව,යුක්තිසහගතව සහ අවංකකමට මුල්තැන ලබාදෙමින් විශේෂයෙන්ම කාන්තා හිංසනට විරුද්ධව කටයුතු කරන ලෙසද ප්‍රකාශ කරන ලදී. ලැබුවාවූ නව තනතුරට සුභ පතන බවත් එමෙන්ම අළුතින් විවාහ වූ ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මියගේද විවාහ දිවියට සුභ පැතුම් එක් කරමින් තම කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන අවසර ගැනීමෙන් පසුව තමන්ද නීතිඥයෙකු ලෙස කටයුතු කරන බවත් තම නීතිඥ කණ්ඩායමට ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය ලඟදී දිවුරුම් දී පැමිණි බවත්, එතුමිය අප සභාවේ ගරු මන්ත්‍රීවරියක් වීම නිසා සභාවේ නීතිඥ කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව වැඩි වීම පිළිබඳව සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යුගයේ තිබෙන කතිකාවත නම් පාර්ලිමේන්තුවටද යම් අය දොස් නඟන බවත් මෙය තෝරා පත් කර ගැනීමේ ක්‍රමය බවත් ප්‍රකාශ කරන ලදී. වෘත්තීයවේදීන්, යම් උගත්කමක් තිබෙන පුද්ගලයින් දේශපාලනයට අවශ්‍යයැයි මතයක් තිබෙන යුගයක මෙතුමිය අප සමඟ සම්බන්ධ වීම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ශක්තියක් බවත් තරුණ යුවතියක් බැවින් වෙන්නප්පුවට සේවය කිරීමට කාලය තිබෙන බවත් ප්රකාශ කරන ලදී. කාන්තාවන්ට දරා ගැනීමේ ශක්තිය හා සවන්දීමේ ශක්තිය තිබෙන බවත් දේශපාලන ජීවිතය තුළ දරා ගැනීම අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවියට සුභ පැතුම් එක් කරමින්ද එමෙන්ම අළුතින් විවාහ වූ ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මියගේද විවාහ දිවියට සුභ පැතුම් එක් කරමින් තම කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රීනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම පදවිය ලබා ගැනීම වෙනුවෙන් තමන් විශාල ලෙස කැපවීම් කරමින් වෙහෙස මහන්සි වූ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස තමන්ට මෙම පදවිය ලැබුණ බවත් ලැබුවාවූ නව පදවිය තුළ එය රැකියාවක් කර නොගෙන සමාජයට සේවයක් ඉටු කිරීමට තමන් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම තමන්ට සුභ පැතුම් එක් කල සියළුම දෙනාටද ස්තුතිය පුද කරන ලදී.

11. අධිකරණ අමාත්‍ය එම්.යූ.එම්.අලි සබ්‍රි මැතිතුමා විසින් මුළු දිවයින සඳහා සමාදාන විනිශ්චයකාරවරයෙකු ලෙස අප සභාවේ ලේකම්තුමාව පත් කර එවා ඇති බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. එම පත්වීම් ලිපිය ලේකම්තුමාට ගරු සභාපතිතුමා විසින් මහා සභාවේදී ප්‍රධානය කරන ලදී.
12. 2022 වර්ෂයට අදාල වාර්ෂික සංවර්ධන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම,වාර්ෂික කාර්ය සාධන සැලැස්ම , වාර්ෂික පුහුණු සැලැස්ම වාර්ෂික ආංශික සැලැස්ම,වාර්ශික අභ්‍යන්තර විගණන සැලැස්ම හා වාර්ෂ්ක සණ අපද්‍රව්‍යයකලමනාකරණ සැලැස්ම ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

**a. ගරු සභාපතිතුමාගේ යෝජනා**

i. සේවා ගිවිසුම් කාලය අවසන් වන සේවක මහත්මමහත්මීන් 30 දෙනෙකුගේ සේවා කාලය දීර්ස කිරීම සඳහාසභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු මහා සභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී යූ.ප්‍රද්ඩ එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව යම් සේවක මහත්ම මහත්මීන්ගේ සේවා කාලය 2021.12.30 සිට 2022.01.29 වන දින දක්වා මාසයකින් දීර්ස කර ඇති බවත් ඒ පිළිබඳව විමසා සිටින ලදී.

සයමසකට කාලය දීර්ස කරන බවත්, මෙය සුදුසු දෝෂයකින් වැරදිමකින් සිදු වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය නිවැරදි කර අනුමැතියට යවන ලෙසට ලේකම්මහතාට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තීරණ අංක 08

සේවා ගිවිසුම් කාලය අවසන් වන පහත නම් සඳහන් සේවක මහත්මමහත්මීන් 30 දෙනෙකුගේ සේවා කාලය දීර්ස කිරීම සඳහා වූ **යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| අ.අ | නම | තනතුර | ගිවිසුම් කාලය දීර්ස කර ගත යුතු කාලය |
|---|---|---|---|
| 01 | යූ. සුලානි මහේෂිකා ප්‍රනාන්දු මිය | පුස්තකාල සහයක (කම්මල්පත්තුව පුස්තකාලය) | 2021.12.29 දින සිට 2022.06.28 |

| | | | |
|---|---|---|---|
| 02 | කේ. අෂේනි ප්‍රිසන්කි ප්‍රනාන්දු මෙය | පුස්තකාල සහයක (ලුණුවිල පුස්තකාලය) | 2021.12.29 දින සිට 2022.06.28 |
| 03 | යූ.ඒ. ෂෙහාරා මධුෂානි මෙය | පුස්තකාල සහයක කහටවිල | 2021.12.29 දින සිට 2022.06.28 |
| 04 | එච්.ඉරේෂ් චාමර මයා | පුස්තකාල සහයක (ප්‍රධාන කාර්යාලය) | 2021.12.29 දින සිට 2022.06.28 |
| 05 | බී. මදූෂා ලක්මිණි මෙය | පුස්තකාල සහයක මහයායවත්ත | 2021.12.29 දින සිට 2022.06.28 |
| 06 | දසුනි අගලියවන්න | පුස්තකාල සහයක (බූජ්ජම්පල පුස්තකාලය) | 2021.12.29 දින සිට 2022.06.28 |
| 07 | ඕවිටිගලගේ භාග්‍යා ලක්මිණි මෙය | පුස්තකාල සහයක (වෙන්නප්පුව පුස්තකාලය) | 2022.01.03 දින සිට 2022.07.02 |
| 08 | ජේ.අයි.රවිඳු තාරක මයා | පුස්තකාල සහයක (කම්මල්පත්තුව පුස්තකාලය) | 2022.01.03 දින සිට 2022.01.02 |
| 09 | ඩබ්.ඒ.අයි. කල්පනී විජේසිංහ මෙය | පෙර පාසල් සහයිකා (කිරිමැටියාන නෙළුම්වැව) | 2022.01.21 දින සිට 2022.07.20 |
| 10 | එස්.එම්. යමුනා ලක්මාලි මෙය | පෙර පාසල් සහයිකා (මැටිකොටුව පෙර පාසල) | 2022.01.21 දින සිට 2022.07.20 |
| 11 | ඩී.එච්.ඒ.ඩී.නිමේෂා මධුෂානි වීරසිංහ මෙය | පෙර පාසල් සහයිකා දංකොටුව පෙර පාසල | 2022.01.21 දින සිට 2022.07.20 |
| 12 | එස්.එම්.සී.එන්.සිත්මි පෙරේරා මෙය | ආයුර්වේද සහයක (දංකොටුව ආයුර්වේදය) | 2022.01.20 දින සිට 2022.07.19 |
| 13 | ඩබ්.ආර්. සෙව්වන්දි තිසේරා මෙය | කාර්යාල කාර්යය සහයක (ප්‍රජා සංවර්ධන අංශය) | 2022.01.21 දින සිට 2022.07.20 |
| 14 | ඩබ්.ඒ.එස්.රසාරා ජාන්ස මෙය | කාර්යාල කාර්යය සහයක (කර්මාන්ත අංශය) | 2022.01.21 දින සිට 2022.07.20 |
| 15 | ඩබ්.ඒ. ලහිරු සාගර මයා | රියදුරු (වෙන්නප්පුව සෞඛ්‍ය) | 2022.01.27 දින සිට 2022.07.26 |
| 16 | ඩබ්.පී. ලලිත් සංජීව මයා | මුරකරු දංකොටුව | 2022.01.04 දින සිට 2022.07.03 |
| 17 | බී.ෂාමල් මධුක මයා | වැඩ කම්කරු (දංකොටුව ආයුර්වේද) | 2022.01.25 දින සිට 2022.07.24 |
| 18 | ඩබ්.එනක්ෂි ජයාෂා වාස් මෙය | වැඩ කම්කරු (ඇල්බට් ක්‍රීඩාංගණය) | 2022.01.25 දින සිට 2022.07.24 |
| 19 | එච්.ඩී. මධුකා දේශානි මෙය | වැඩ කම්කරු (පෙරටු කාර්යාලය) | 2022.01.25 දින සිට 2022.07.24 |
| 20 | ජේ.පී.රුවන් කුමාර | වැඩ කම්කරු (දංකොටුව උපකාර්යාලය) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 21 | එම්.නිපුනි අයේෂා ප්‍රනාන්දු මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 22 | පී.කේ. සමාධි අනුරුද්ධිකා මිය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 23 | එම්.එම්.උදයකුමාර මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 24 | ටී.එම්.ඩී. සයනා දුල්ෂාරා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |

| | | | |
|---|---|---|---|
| 25 | ආර්.ජ්. පුෂ්ප කුමාර මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 26 | කේ.ජේ.පී.එස්. සුරේනි ප්‍රනාන්දු මිය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 27 | යූ. අශාන් දුලන්ගික මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 28 | එස්.ජී.එම්.ප්‍රසාදි වාසනා මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 29 | එම්.නිපුනි උදේශිකා ප්‍රනාන්දු මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |
| 30 | යූ.රොෂාන් නතාල් ප්‍රනාන්දු මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2021.12.30 දින සිට 2022.06.29 |

ii. දංකොටුව නව වෙළඳ සංකීර්ණයේ අදියර I සහ II කඩ කාමර සඳහා වන නව තක්සේරු කුලිය 2022 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු මහා සභාවට යෝජනා කරන්නීය.

මෙම ඉදිරිපත් කර තිබෙන වාර්තාව හා අද දින ඉදිරිපත් කල වාර්තාව අතර තිබෙන සම්බන්දතාවය ගරු මන්ත්‍රී එම්.එම් ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මේ සමබන්දයෙන් පොදු පහසුකම් කමිටුවේදී සාකච්ඡා කලේ දැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

මෙය සාකච්ඡා නොකල බව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. සභාවට ඉදිරිපත් කර තිබෙන ලිපියේම සඳහන් කඩ කාමර අද දින ලබා දුන් ලිපියේද සඳහන් වන බවත් ප්‍රකාශ කරන ලදී.

මුදල් ලබා දි විවෘත නොකල කඩ කාමර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අලුතින් බදු දීමට යෝජිත ලෙස සඳහන් වන බවත් ගරු මන්ත්‍රී එම්.එම් ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මෙහිදී සඳහන් කරනුයේ එම පුද්ගලයින්ගෙන් ඉවත් කර නව පිරිසකට බදු දීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ පිලිබඳව සම්පූර්ණ වාර්තාවක් ලබා ගත යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කීමනි (key Money) ක්‍රමයට එම කඩ කාමර බදු ලබා දුන් බවත් , එලෙස ලබා දුන්නේ නම් අයිතිකරුවෙකු නැතිවිය නොහැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම් ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය නිරීක්ෂණයට ගියේ දැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.මේ පිලිබඳව ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා දන්නා බවත් ප්‍රකාශ කරන ලදී. ජනතාව මුදල් ගෙවා කඩකාමර විවෘත කිරීමට බලා සිටියද තවමත් එම කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බවද ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව යම් කඩ කාමර විවෘත කිරීමේ ගැටලුවක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා විශාල කාලයක් ගත්තද මෙය විසදා නොගන්නේ නම් ආදායමක් ද නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී

ඉදිරියේ තිබෙන රවුම් කොටස කඩා ඉවත් කරන ලෙසට ඉල්ලීමක් කල බවත් , එය සිදුකර ගැනීමට නොහැකි වූ බවත් ,එම රවුම් කොටස නිසා පසුපස කඩ කාමර 14 පමණ ආවරණය වී වැසී ඇති බවත් , එම මිනිසුන්ට වෙළදාම් කිරීමට නොහැකි බවත් ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. අනෙක් පසින් මාලු කඩය තිබෙන කොටසේද කඩ කාමර කීපයක් විවෘත කිරීමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එම කොටස කඩා දී මෙම කඩ කාමර විවෘත කරන ලෙසත් , මෙය මහා සභාවේ යෝජනා කර කුරුණෑගල යැවූ පසුව එමගින් නැවතත් ආපස්සට එය පැමිණි විට

කිසිවක් කර ගැනීමට නොහැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා මහා සභාවේ තීරණයක් ගෙන මෙම කටයුත්ත අවසන් කරමු යැයි ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

කීමනි( key Money) වලට කුමක් සිදුවේදැයි ද ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ද සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

කීමනි (key money) ගත් පුද්ගලයින් කඩ කාමර වසාගෙන සිටින බවත් , වසර ගණනාවකින් භාවිත කර නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාසික කුලිය නොගෙවූ අයගේ මුදල් කීමනි (KEY MONEY) වලින් අඩුකල හැකි බවද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සතියක් ඇතුලත මේ පිලිබඳව දන්නා ගරු මන්ත්‍රීවරුන් කීපදෙනෙකු ගොස් නිරීක්ෂණය කර මෙම කටයුත්ත අවසන් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඝෝෂාව.....

එළවලු කඩ වලට දීමට කඩ කාමර සෑදුව බවත් නමුත් ඒවා නොදී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එදා එසේ පවසා කඩ කාමර සෑදීමට ගත්තද ඒවා වෙනත් අයට ලබා දී එළවලු කඩ සඳහා ලබා නොදුන් බවත් ගරු මන්ත්‍රී ඕ.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය සති දෙකකින් සිදුකර අවසන් කල හැකි දැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

මෙය ගොස් නිරීක්ෂණය කල බව ගරු මන්ත්‍රී ඩබ්. ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මේ සඳහා සමස්ථ වැඩ පිලිවෙලක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්. එම් කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. එහි උඩුමහලේ වහලය සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ පිලිබඳව ගරු සභාපතිතුමාම ගොස් නිරීක්ෂණය කර වාර්තාවක්ද ගෙන මුල සිට අගට යන ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්. එම් කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ද සිරිවර්ධන ප්‍රනාන්දු මහතා, ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව වසා තිබෙන කඩ කාමර සඳහා යම් අධිභාරයක් පැනවීමට නොහැකි දැයි විමසා සිටින ලදී.

එම ජනතාවගේ ද කාරුණික ඉල්ලීමක් තිබෙන බවත්, වෙළඳාම් කිරීමට හැකි ලෙස සකස් කර දෙන ලෙසට ඔවුන් ඉල්ලීම් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අයිතිකරුවන් ඉදිරිපත් නොවන කඩ කාමර සඳහා තීරණයක් ගැනීමට හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී .

ඉල්ලීමක් කර තිබෙන අය සම්බන්ධව සලකා බලමු යැයිද , කිසිවක් ඉදිරිපත් නොකල අය සම්බන්දව එලෙස කටයුතු කරමුයැයි ද ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ද සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙයට විසඳුමක් දුන්නද එළවලු කඩ හිමියන්ටද විසඳුමක් ලබා දිය යුතු බව ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එළවලු කඩ හිමියන්ට ඉදිරිපසින් පිලිවෙලට සාදා දුන් විට ඔවුන් කිසිදිනක අකමැති  නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එළවලු කඩ ඉදිරිපසින් සෑදුවද නැවත අනෙක් කඩ කාමර වැසී යන බවත් ගරු  මන්ත්‍රී  ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා  ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපසින් තිබෙන රවුම් කොටස ඉවත් කර දමන ලෙසත් , එය මේ සඳහා  තිබෙන එකම අවහිරය බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මෙම කඩ කාමර පිලිබඳව මීන් පෙර සාකච්ඡා කල මන්ත්‍රී කන්ඩායමක් එය නිරීක්ෂණයට ද ගිය බවත් , මේ පිලිබඳව පැහැදිලි කිරීමක් ලේකම්තුමාගෙන් ගරු මන්ත්‍රී එල්. කේ.ජගත් ප්‍රියංකර මහතා ඉල්ලා සිටින ලදී.මේ සඳහා යම් පරිපාලන බාදාවක් ඇතැයිද නැතහොත් අප අකමැත්තකින් මෙය නතර නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුලු සියලුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව , මෙම සභාවට අයත් කඩ කාමර වල ගැටලු රාශියක් පැවති හෙයින් කමිටු වල තීරණ ගෙන කොමසාරිස්  තුමාටද ඉදිරිපත් කර එමගින් විමර්ශන නිලධාරීන් 03 දෙනෙකු මේ සම්බන්යෙන් කටයුතු කිරීමට පත් වී පැමිනි බව  ප්‍රකාශ කරන ලදී. එම නිලධාරීන් යෝගියාන කඩ කාමර වල වැඩ අවසන් කල බවත් , එහිදි ද කීමනි (key money) වලට බදු ගෙන තිබුනද ඒවායෙහි අයිතිකරුවන් නොසිටි බවත් , ගිවිසුම් නොතිබුන බවත් පසුව ඔවුන් ට ලිපි යවා ගෙන්වා  කටයුතු අවසන් කර ඉතිරි කඩ කාමර  මේ වන විට ටෙන්ඩර් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ටෙන්ඩර් කිරීමෙන් පසුව ගිවිසුම් අත්සන් තර හිගගෙවා භාර ගැනීමට එම අය සූදානම් බවත් එලෙස   යෝගියාන කඩ කාමර නිවැරදි  කරගත් බවත් ප්‍රකාශ කරන ලදී.

එලෙසම දංකොටුව කඩ කාමරද කොමසාරිස්තුමා විසින් විමර්ශන නිලධාරීන්ට පැවරූ බවත් , එහිදී ද දංකොටුව කඩ කාමර වල කීමනි (key money) ගෙවීම නිවැරදිව සනාථ කර ගැනීමට නොහැකි බවත්, ගිවිසුම් නොමැති බවත් ලේකම්මහතා  ප්‍රකාශ කරන ලදී. අනුමැතියක් ගෙන එම   කඩ කාමර ටෙන්ඩර් කිරීමට දැමූවිට ඒ අය තමුන් සතු ලිපිලේඛන සමග පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී. හිඟ තිබේනම් ඔවුන්ගෙන් ඉල්ලීම් ගෙන එම කටයුතු නිවැරදි කිරීමට හැකි බවත්, අළුතින් කිසිවෙකුට ගිවිසුමක් නොමැතිව ලබා නොදෙන බව ද ප්‍රකාශ කරන ලදී.මෙතෙක් වසර ගණනාවක් ගිවිසුම් නොමැතිව සිටි පිරිසව ගිවිසුම්ගත කිරීමට මෙම වැඩ පිළිවෙල යොදාගත් බවද ප්‍රකාශ කරන ලදී.

එම ඉදිරිපස තිබෙන කොටස ගලවා දැමිය යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉවත් කිරීම පිළිබඳව උපදෙසක් ලේකම්තුමාට ලැබී නොමැතිදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

යම් කඩ කාමර වසා තිබීම තුළ සභාවට අදායම් නොලැබෙන බවත්, එම ජනතාවටද ආදායමක් නොමැති බවත් ගරු මන්ත්‍රි ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. රට දියුණුවීමේදී වෙනස් කිරීම් සිදු කිරීමට සිදු වන බැවින් අනාගතයට ගැලපෙන ලෙස ඉදිකිරීමක් කර සියළුම දෙනාට සාදාරණයක් සිදු කරන ලෙසද ප්‍රකාශ කරන ලදී.

එය කඩා ඉවත් කිරීමට බාධාවක් තිබේදැයි ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා විමසා සිටින ලදී.

එය ඉහළ මහලට සම්බන්ධ වී ඇති බවත්, යම් හානියක් ඉහල මහලට සිදු වී  කඩා වැටෙතැයි සිතා එය ඉදිකර  ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අළුතින් බදු දීමට යෝජිත යැයි සඳහන් කර ලිපියක් සභාවට ලැබී ඇති බවත්මේ සඳහා බදු දීමට සභාවෙන් අනුමැතිය දුන් විට කවුරුන් හෝ නොඉල්ලුවහොත් ඉල්ලූ අයව ප්‍රතික්ෂේප කිරීම සඳහා උපක්‍රමයක් මෙහිදි ගෙන තිබේදැයි ද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙහිදී දැනට ටෙන්ඩර් ගත් පුද්ගලයින් ද නොගත් පුද්ගලයින්ද සිටින බවත්, අවශ්‍ය ලියකියවිලි තිබෙන නොතිබෙන පිරිසද සිටින බවත් ප්‍රකාශ කරන ලදී. මෙම සියළු දෙනාටම සභාවෙන් මේවා සඳහා ඉදිරිපත් වන ලෙසට දැනුම් දුන් බවත් නමුත් කිසිවෙකු ඉදිරිපත් නොවුන බවත් එබැවින් මෙය නැවත ටෙන්ඩර් කරන ලෙසටමෙම යෝජනාව කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. අයිතිය තහවුරු කරන්නේද නැතිනම් කුලියද නොගවන්නේ නම් මේ පිළිබඳව සභාවට ගෙන නැවත ටෙන්ඩර් කරන ලෙසට මෙහිදී සාකච්ඡා වූ බවද ප්‍රකාශ කරන ලදී.

මෙමඟින් ඉක්මනින් ඉදිරි කටයුතු සිදු කිරීමට හැකිදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

ඉදිරිපස තිබෙන කොටස කැඩිය යුතුමයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා තීන්දුව මහා සභාවෙන් ලබාදෙන බවත්,එහිදි ගැටළුවක් නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපස කැඩීමට පවසනුයේ පදිංචි කඩ කාමරයක් යැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

එහි ඉදිරිපස කැඩීමට යන කොටසේ පදිංචියක් නොමැති බවත්, එය අලංකාරය සඳහා නිර්මාණය කර තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එමඟින් ගොඩනැඟිල්ලට හානියක් නොමැති බවට පවසා වාර්තාවක් ලබා දෙන ලෙසටද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව එලවළු කඩ එම ස්ථානයේ දමා වසර 13 පමණ වන බවත්, එම වසර 13ටම තාවකාලික මඩු වල එම කඩ කාමර තිබෙන බවත්,එයට මෙම ගොඩනැඟිල්ලෙන් කඩ කාමර ලබාදෙන ලෙසත් එසේත් නොමැතිව එම කඩ කාමර එම ස්ථානයෙන් ඉවත් නොවන බවද ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

වාහන පාක් එකක් අවශ්‍ය බවත්, සෑම සතියේම සඳුදා දිනයේදී වාහන ගමන් කිරීමට නොහැකි බවත්, මාළු මාකට් එකට එලවළු පොලට යාමට නොහැකි වී ඇති බවත් ඉතාමත් නරක ලෙස දංකොටුව පොල පවත්වාගෙන යන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.ලබන සතියේ සිට දංකොටුව පොලට පැමිණෙන පාරිභෝගිකයින්ගේ වාහන පමණක් තබා අනෙක් වාහන ඉවත් කරන ලෙසට බලයලත් නිලධාරී දැනුවත් කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

කමිටුවක් නිර්දේශ කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා ගොස් නිරීක්ෂණය කර මේ සඳහා වාර්තාවක් ලබාදෙන ලෙසත් එය තිරණය කර තමන්ට පවසන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා මෙහිදී පවසා සිටියේ එම අවස්ථාවට ගරු සභාපතිතුමාද පැමිණ මෙය නිරීක්ෂණය කරන ලෙසයි.

| |
|---|
| තීරණ අංක 09<br><br>**මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කල ගරු මහා සභාව සතියක් ඇතුළත එම කඩ කාමර** |

**නිරීක්ෂණය කර වාර්තාවක් ලබාදීම සඳහා කමිටු සාමාජිකයින් ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සහ ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා පත් කරන ලදී.**

iii. 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා ලැබී ඇති අයදුම්කරුවන්ගේ ලේඛණය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම ට අදාලව ගරු සභාපතිතුමා විසින් මහා සභාව වෙත යෝජනා කරන ලදී.

තීරණ අංක 10

**2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් අනුමත කර ගැනීම සුදුසු බවටත්, එමෙන්ම අවශයතාවය මත බල ප්‍රදේශයේ ඉදිරිපත් වී නොමැති සැපයුම්කරුවන්ගෙන් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## b.ගරු මන්ත්‍රී යෝජනා

i. ප/මොහොට්ටිමුල්ල දළුවෙල කනත්ත පාරින් ආරම්භ වී ජසින්තා ප්‍රනාන්දු මහත්මියගේ නිවස අසලින් අවසන් වන මාර්ගය ටයිටස් පෙරේරා මාවත ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාවට යෝජනා කරන්නීය.

තීරණ අංක 11

ප/මොහොට්ටිමුල්ල දළුවෙල කනත්ත පාරින් ආරම්භ වී ජසින්තා ප්‍රනාන්දු මහත්මියගේ නිවස අසලින් අවසන් වන මාර්ගය ටයිටස් පෙරේරා මාවත ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- **මාර්ගයේ නම -ටයිටස් පෙරේරා මාවත**
- **ආරම්භක ස්ථානය-දළුවෙල කනත්ත පාර**
- **අවසන් වන ස්ථානය-නිවස (ජසින්තා ප්‍රනාන්දු නිවස)**
- **මාර්ගයේ දිග- මීටර් 210**
- **මාර්ගයේ පළල- මීටර් 3.7**
- **ග්‍රාම සේවා වසම- ප/මොහොට්ටිමුල්ල**

ii. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බ/කොළින්ජාඩිය වසමේ " බ්ලූ ස්ටාර් ප්‍රජා මණ්ඩලය" නමින් පිහිටුවාගෙන ඇති ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 12<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බ/කොළින්ජාඩිය වසමේ " බ්ලූ ස්ටාර් ප්‍රජා මණ්ඩලය" නමින් පිහිටුවාගෙන ඇති ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

iii. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැ/කොළින්ජාඩිය වසමේ " ලූර්දු මාතා ප්‍රජා මණ්ඩලය" නමින් පිහිටුවාගෙන ඇති ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 13<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැ/කොළින්ජාඩිය වසමේ " ලූර්දු මාතා ප්‍රජා මණ්ඩලය" නමින් පිහිටුවාගෙන ඇති ප්‍රජා මණ්ඩලය වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

**iv. 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා බොරලැස්ස කොට්ඨාසයට වෙන් කර තිබූ මුදලින් රු.139,000.00ක මුදල් ඉතිරි වී ඇති බැවින් පහත සඳහන් සංවර්ධන කටයුතු එම මුදලින් ඉටු කර දෙන ලෙසට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.**

- ❖ **ද/මිරිස්සන්කොටුව රනිල් මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් යොදා පිළිසකර කිරීම**
- ❖ **ද/බොරලැස්ස මිනිපිටිය ඉදිරිපිට කාණුවේ කොටසක් සඳහා මතුපිට ආවරණය කිරීම**

| |
|---|
| තීරණ අංක 14 |

**2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා බොරලැස්ස කොට්ඨාසයට වෙන් කර තිබූ මුදලින් රු.139,000.00ක මුදල් ඉතිරි වී ඇති බැවින් පහත සඳහන් සංවර්ධන කටයුතු එම මුදලින් ඉටු කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව කර්මාන්ත කමිටුවට යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. මෙම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- **ද/මිරිස්සන්කොටුව රනිල් මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් යොදා පිළිසකර කිරීම**
- **ද/බොරලැස්ස මිනිපිටිය ඉදිරිපිට කාණුවේ කොටසක් සඳහා මතුපිට ආවරණය කිරීම**

## 04 .කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2021.11.05/ 2021.11.12/ 2021.12.24 / 2021.11.26 සහ 2021.11.30 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම.

2021/11/12 වන දින පැවති මුදල් කමිටු වාර්තාවේ පාසල් පොත් සම්බන්ධයෙන් සඳහන් වන බවත්, මේ වන විට නැවතත් COVID- 19 ගැටළුව තිබෙන බැවින් පාසල්වලට ළමුන් කණ්ඩායම් වශයෙන් ගෙන්වන බවත් එහිදී විදුහල්පතිතුමාගේ නිර්දේශය යනුවෙන් සඳහන් වන කොටසේද ගැටළුවක් මතු වී ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එහිදී ග්‍රාම නිලධාරී සහතිකය පමණක් ප්‍රමාණවත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් අයදුම් පත්‍රයේ විදුහල්පති නිර්දේශය සඳහන් වන බවත්, ග්‍රාම නිලධාරී සහතිකය පමණක් ප්‍රමාණවත් නම් විදුහල්පති සහතිකය මෙම අයදුම්පත්‍රයට ඇතුළත් කළේ මන්දැයි ද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

තමන්ට කතා කළ ගරු මන්ත්‍රීවරුන්ට සහ දෙමාපියන්ට ග්‍රාම නිලධාරී සහතිකය හෝ විදුහල්පති සහතිකය යන දෙකෙන් එකක් ප්‍රමාණවත් බවට තමන් පැවසූ බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

සමහර ග්‍රාම නිලධාරී මහතුන් විදුහල්පති අත්සන නොමැතිව අත්සන් නොකරන බව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලදී. පාසල් යන දරුවෙක්දැයි සනාථ කරගත යුතු බවට ඔවුන් පවසන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ග්‍රාම නිලධාරි විදුහල්පති නිර්දේශය නොමැතිව අත්සන් නොකරන බව ගරු මන්ත්‍රිනී ආර් නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ද ප්‍රකාශ කරන ලදී.

මෙය ඉතාමත් කාරුණිකව ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් මේ පිළිබඳව දැනුවත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් හෙටම අදාල ප්‍රාදේශීය ලේකම්තුමා/තුමිය දැනුවත් කරන බවත්, ලබන සතියේ පැවැත්වෙන ග්‍රාම නිලධාරී රැස්වීමේදී ද තමන් දැනුවත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2021.11.12 වන දින පැවති මුදල් කමිටු වාර්තාවේ වෙන්නප්පුව සතිපොළ සඳහා තණකොළ කපන යන්ත්‍රයක් ඉල්ලා ඇති බවත් මෙම ඉල්ලීම් කමිටු හරහා පැමිණිය යුතු බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව සතිපොළේ තණකොළ ගස් කොපමණ

තිබේදැයි යන්න පිළිබඳව ද ගැටළුවක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තණකොළ කපන යන්ත්‍රද ඕනෑ තරම් තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුවේ තණකොළ කපන මැෂින් දෙක එම සේවකයින් දෙදෙනා භාරයේ තිබෙන බැවින් අලාභහානි සිදු කරතැයි සිතා වෙනත් අයෙකුට ලබා දීමට අකැමති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සිටින සෑම කෙනෙකුටම දුන්නත් තමන්ට ගැටළුවක් නොවන බවත්, නමුත් සීමිත සම්පත්වලින් වැඩ කටයුතු කල යුතු බවත්, මේවා සඳහා මීට වඩා අවධානය යොමු කරන ලෙසද ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

යම් යම් ස්ථානවලට ලබා දී ඒ සඳහා වගකීමක් ද ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව සතිපොළේ තණකොළ ගස් කොපමණ තිබේදැයි යන්න පිළිබඳව ද ගැටළුවක් තිබෙන බව ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

අයින දිගේ සහ MOH කාර්යාලය දිගේ තණකොළ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා පැවසූ කාරණාව පිළිබඳ තමන්ද කතා කිරීමට සූදානම් වූ බවත්, කම්ටු වාර්තාවට අනුමැතිය දීමට නොහැකි බවත්, තමන් උදෑසන ගොස් එය නිරීක්ෂණයද කර පැමිණි බවත් එම ස්ථානයේ වර්ග අඩි.100ක ප්‍රමාණයකවත් තණකොළ කැපීමට නොමැති බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එම වාර්තාවලම අනික් පස වැටුප් ගෙවීමට මුදල් නොමැති බැවින් ස්ථාවර තැන්පතුවකින් මුදල් ගෙන එම අවශ්‍ය කටයුතු කරන බව සඳහන් වන බවත් ප්‍රමුඛතාවය හඳුනා නොගෙන මෙලෙස අනවශ්‍ය වියදම් සිදු නොකරන ලෙසද ප්‍රකාශ කරන ලදී.

මෙම යන්ත්‍රය කෙදිනකවත් අනවශ්‍ය වියදමක් නොවන බවත්, මෙමඟින් ප්‍රයෝජන ගතහැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අප සභාවේ තණකොළ කපන මැෂින් තිබෙන බවත්, එම සේවකයින් ඒවා ලබා දීමට අකමැති බවට ගරු සභාපතිතුමාම පවසන බවත් එහි තිබෙනුයේ පරිපාලනයේ දුර්වලතාවයක් බවත් ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. අනෙක් පස 4 වන පිටුවේ ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ කටයුතු සඳහා වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් ලබාගෙන ඇති බවත්, ගබඩාවකට වර්ණ මුද්‍රණ යන්ත්‍රයක අවශ්‍යතාවය පිළිබඳව විමසා සිටින ලදී.මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බවද ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි.

ලේකම් මහතා , ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ,ගබඩාවට පමණක් නොව උප කාර්යාලවලටද වර්ණ මුද්‍රණ යන්ත්‍ර ඉල්ලා ඇති බවත් , CAT – 2020 වැඩසටහන සමඟ ඉදිරියට යාමේදී වයඹ සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධ වන බැවින් එම වැඩසටහන link කර පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සිට ගබඩාව මෙහෙයවන බව ප්‍රකාශ කරන ලදී. Scanner යන්ත්‍රයක්ද අවශ්‍ය වී

ඇති බවත් අප දමන දත්ත හා කුරුණෑගලින් එවන දත්තද ගබඩාවෙන්ම ගන්නා බැවින් එම දත්ත Print ගැනීම සඳහා මෙම වර්ණ මුද්‍රණ යන්ත්‍රයක අවශ්‍යාය බව ප්‍රකාශ කරන ලදී. සෑම අංශයකටම වර්ණ මුද්‍රණ යන්ත්‍ර තිබෙන බවත් , ගබඩාවේද සියළුම දත්ත පරිගණක ගත කර ඇති බැවින් සියළුම තොරතුරු ද යාවත්කාලීන කරන බැවින් ඕනෑම අවස්ථාවක තොරතුරු ලබා ගැනීමටද මේ වන විට ගබඩාව තුළින් හැකියාව තිබෙන බවද ප්‍රකාශ කරන ලදී.තාක්ෂණය සමඟ ඉදිරියට යාමේදී එම පහසුකම් අවශ්‍යා බවද, අප සභාවට උප කාර්යාල 3 ක් සමඟද ඉදිරියට යාමට වී ඇති හෙයින් ඉතාමත් සංකීර්ණ බවද ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 15<br><br>2021.11.05 , 2021.11.12, 2021.11.24 ,2021-11-26 සහ 2021-11-30 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2021.10.05 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රිනී අයි.එම්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පොතුවටන කොටස් කරන ලද ඉඩම සම්බන්ධයෙන් වාර්තාවක් අද දින මහා සභාවට ඉදිරිපත් කරන බව සභාපතිතුමා පැවසූ බවත් ඒ සම්බන්ධයෙන් විමසා සිටින ලදී.මහා සභා වාර්තා සමඟ එය ඉදිරිපත් කර නොතිබූ බැවින් ඒ සම්බන්ධයෙන් දැනුවත්වීමක් බලාපොරොත්තු වන බවද ප්‍රකාශ කරන ලදී.

මේ දිනවල වැඩ අධිකාරී මහතා සහ තාක්ෂණ නිලධාරීන් ඉතාමත් කාර්යබහුල බවත්,දෙසැම්බර් මස සියළුම වැඩ අවසන් කර භාර දිය යුතු බවත්, ජනවාරි මස මහා සභාවේදී එ් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහි ගොස් නිරීක්ෂණය කළ විට එම පහසුකම් සාදා නොමැති බවත්, අනුමැතිය ලබා දුන්නේ නම් එය වැරදි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව දික්වෙල මැදගොඩැල්ල මාර්ගයේ එක් පසෙකින් තාප්පයක් සහ තවත් ස්ථානයක කම්බි වැටක් තිබෙන බවත්, කිලෝමීටර් ලක්ෂයේ වැඩ සටහනින් කාපට් කිරීමටද යෝජිත මාර්ගයක් බවත් ප්‍රකාශ කරන ලදී. එක් ඉඩමක් ගමෙන් පිටස්තර කෙනෙකුගේ බවත්, සභාවේ නිලධාරීන් ගොස් නිරීක්ෂණයද කර නවතා දැමූ බවත් එය කඩා සති දෙකක් පමණ වන බවත්ඒවා ඉදිරියට කරගෙන යන බැවින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. තමන්ද මහා සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කල නමුත් ඒවා කාර්මික කමිටුවට යොමු කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

සියළු යෝජනා අදාල කමිටු වෙත යොමු කල බවත්, කමිටු වල සාකච්ඡා කර මහා සභාවට යොමු කරන ලෙසද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එවැනි ගැටළු වලදී ඉතාමත් ඉක්මනින් කටයුතු සිදු කිරීමට සිදු වන බව ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. මාර්ගය කාපට් කිරීමේදීද නැති නම් ගැටළු මතු වන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 16<br><br>2021.11.05 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යු.පුඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2021.11.25 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

කාරක සභා අවස්ථාවේදී මෙම කමිටුව සඳහා පුරප්පාඩුවක් තිබෙන බවත් හිටපු ගරු මන්ත්‍රී එම්.පී.ඩී. උදේෂ් තරංග කරුණාරත්න මහතා වෙනුවෙන් ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතාව යෝජනා කරන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ජනවාරි මස සිට අළුත් කිරීම සඳහා එම යෝජනාව විපක්ෂනායකතුමා වෙත යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

කාන්තා මන්ත්‍රීවරියන් සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදු කිරීමට තිබෙන බවත්, ජනවාරි මස සිට ළමා හා කාන්තා කටයුතු සඳහා කාරක සභාවක් ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සභාපතිත්වයෙන් යෝජනා වූ බවත් එමෙන්ම නීතියක් නොමැති රටක නීතිඥවෘත්තිය අළුතින් විපක්ෂයේ මන්ත්‍රීවරියක් වන ගරු මන්ත්‍රීනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය භාරගත් බවත්, එය විශාල අභියෝගයක් බවත් එතුමියට සුබ පතන බවත් ප්‍රකාශ කරන ලදී.

කිසිම කෙනෙකුට නීතිය ක්‍රියාත්මක නොවන බව පැවසීමට නොහැකි බවත්, නීතියක් නොමැති රටක් යන වචනය ඉල්ලා අස් කරගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

| |
|---|
| තීරණ අංක 17<br><br>2021.11.25 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය |

වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

iv. 2021-12-01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 18

2021-12-01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## **05. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.**

I. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය- 2021 සැප්තැම්බර්
II. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය - 2021 සැප්තැම්බර්

තීරණ අංක 19

2021 සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2021 සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

iii. 2021 නොවැම්බර් මස ඉන්ධන හා අලුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව හා 2021 නොවැම්බර් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු මහා සභාව සලකා බලන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

i. මෙය ක්‍රීඩා කමිටුවේ සාකච්ඡා කල යුතු දෙයක් බවත්, ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩාව ආරම්භ වී 2022/01/21 දිනට වසර 100 ක් සපිරෙන බවත් ඒ සඳහා පලමු තෑගි 04 අප සභාවෙන් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

තීරණ අංක 20

**ශ්‍රී ලංකාවේ මළල ක්‍රීඩාව ආරම්භ වී 2022/01/21 වන දිනට වසර 100 සපිරීම නිමිත්තෙන් පවත්වනු ලබන මාර්ග ධාවන තරඟය සඳහා පහත පරිදි මුදලින් (රු.24,000.00) අනුග්‍රහය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**18න් පහල බාලක**

**ප්‍රථම ස්ථානය - රු.3000.00**

**දෙවන ස්ථානය- රු.2000.00**

**තෙවන ස්ථානය-රු.1000.00**

**රු.6000.00**

**18න් පහල බාලිකා**

**ප්‍රථම ස්ථානය - රු.3000.00**

**දෙවන ස්ථානය- රු.2000.00**

**තෙවන ස්ථානය-රු.1000.00**

**රු.6000.00**

**18න් ඉහළ බාලක**

**ප්‍රථම ස්ථානය - රු.3000.00**

**දෙවන ස්ථානය- රු.2000.00**

**තෙවන ස්ථානය-රු.1000.00**

**රු.6000.00**

**18න් ඉහළ බාලිකා**

**ප්‍රථම ස්ථානය - රු.3000.00**

**දෙවන ස්ථානය- රු.2000.00**

**තෙවන ස්ථානය-රු.1000.00**

**රු.6000.00**

ii. විදාතා ආයතනය මඟින් වෙන්නප්පුව සතිපොල පරිශ්‍රයේ ආහාර අලෙවිය සඳහා තාවකාලික කුටියක් තබා ගැනීමට අවසර ඉල්ලා ඇති බවත්, වෙන්නප්පුව සතිපොලේ කැන්ටීම මේ වන විට සිදු නොකරන බවත් එබැවින් එම ආපන ශාලාව සාධාරණ මුදලකට ලබාදෙමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 21<br><br>ගරු මහා සභාව මේ පිළිබඳව සාකච්ඡා කල අතර වෙන්නප්පුව පොළ භූමියේ තිබෙන ආපන ශාලාව මේ වන විට භාවිතා නොකරන බැවින් එය ඔවුන්ට සුළු මුදලකට ලබාදෙමුයැයි ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී. **එම යෝජනාව එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

iii. නිව් යංග්ස් පාපන්දු (පෞද්.) සමාගම සතියට දෙවරක් ක්‍රීඩකයින්ගේ ශාරීරික සුවතාව වෙනුවෙන් පිහිනුම් තටාකය නොමිලයේ ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සමාගමක් නම් ගෙවීම් සිදු කල හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නඩත්තු කටයුතු නොමිලයේ සිදු නොවන බවත්,පාසල් දරුවන්ට නොමිලයේ ලබා දීම ගැටළුවක් නොවන බවත් ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය වෙන්නප්පුවේ තිබෙන එකම පාපන්දු ක්‍රීඩා සාමාජය බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

iv. දංකොටුව රෝහලේ අළුත්වැඩියාව සම්බන්ධයෙන් පසුගිය මහා සභාවේදී සාකච්ඡා වූ බවත්, වෛද්‍යතුමාව මහා සභාවට ගෙන්වා ආධාර මුදල් ලබා දීමට සාකච්ඡා වුවද එතරම් මුදලක් ගරු මන්ත්‍රීවරුන් ලබා දී නොමැති බැවින් තමන්ටහැකි අයුරින් මුදල්ක ලබා දෙන ලෙසටද ගරු සභාපතිතුමා ඉල්ලා සිටින ලදී. මුදල් ලබා දුන් ගරු මන්ත්‍රීවරුන්ටද ස්තූතිය පුද කරන ලදී.

මෙය සභා අරමුදලින් ලබා දීමට නොහැකි දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී. එය සලකා බලමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

v. දැව සඳහා තේක්ක ගස් ඉල්ලීම පිළිබඳව පසුගිය මහා සභාවටද යොමු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල ඉල්ලීම කොට්ඨාසභාර මන්ත්‍රීවරයා හරහා පැමිණිය යුතු බව ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මොහොට්ටිමුල්ල සුසාන භූමියද සභාවට පවරාගෙන නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙසේ එම ස්ථානවල තිබෙන ගස් අයුතු ලෙස භාවිතා කල හැකි දැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සුසාන භූමිය පවරා දුන් පසුව,භූමියේ තිබෙන ඉඩ මදි වීම තුළ ගස් ඉවත් කර ගැනීමට බලතලය සභාවට තිබෙන බවත්,අවශ්‍යතාවය මත සභා අනුමැතියක් ගෙන එය සිදු කල යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. දරුවන් අධයාපනය ලබන දහම් පාසල් ගොඩනැඟිල්ල සඳහා මෙය ඉල්ලා ඇති බවත්මේ සඳහා බලය අපට ලබ් දීමට නොහැකි බැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමාට ලියා යවනා බවත්,

තාක්ෂණ නිලධාරීන් ගොස් නිරීක්ෂණය කර අවශ්‍ය නිර්දේශය ලබාදෙන ලෙසට තීරණය කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙවැනි දේකදී අදාල කොට්ඨාස මන්ත්‍රීවරයාව දැනුවත් කරන ලෙසට පවසන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සාමාන්‍යයෙන් නායක හාමුදුරුවන් හා මීසම් පාලක පියතුමන්ලා තමාව හමු වීමට පැමිණෙන බවත් මින් ඉදිරියට ඒ පිලිබඳව එතුමන්ලා දැනුවත් කිරීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 22

**මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කල අතර තාක්ෂණ නිලධාරී වාර්තාවක් මේ සම්බන්ධයෙන් ගෙන මෙය ප්‍රාදේශීය ලේකම්තුමා වෙත දන්වා යවමුයැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

vi. **2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා දංකොටුව කොට්ඨාසයෙන් ලබා දී තිබූ කැබැල්ලවලහේන කාණු පද්ධතිය සැකසීම සඳහා වූ යෝජනාව වෙනුවට දංකොටුව සී.ජේ. මාවතේ කාණු පද්ධතිය සැකසීම සඳහා වූ** ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.**

තීරණ අංක 23

**2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා දංකොටුව කොට්ඨාසයෙන් ලබා දී තිබූ කැබැල්ලවලහේන කාණු පද්ධතිය සැකසීම සඳහා වූ යෝජනාව වෙනුවට දංකොටුව සී.ජේ. මාවතේ කාණු පද්ධතිය සැකසීම සඳහා වූ** ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා **විසින් ඉදිරිපත් කල යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

vii. **2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා ලුණුවිල කොට්ඨාසයෙන් ලබා දී තිබූ 7/ඒ පියරත්න නිවස පාර තාර දැමීම සඳහා වූ යෝජනාව වෙනුවට 7/සී සුරුවම අසල පාර හා පියල්ගේ අම්මගේ නිවස අසල මාර්ගය තාර දැමීම සඳහා වූ** ගරු මන්ත්‍රිනී ජේ.කේ.දිපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය **විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.**

තීරණ අංක 24

**2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා ලුණුවිල කොට්ඨාසයෙන් ලබා දී තිබූ 7/ඒ පියරත්න නිවස පාර තාර දැමීම සඳහා වූ යෝජනාව වෙනුවට 7/සී සුරුවම අසල පාර හා පියල්ගේ අම්මගේ නිවස අසල මාර්ගය තාර දැමීම සඳහා වූ** ගරු මන්ත්‍රිනී ජේ.කේ.දිපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය **විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

viii. 2022 වර්ෂය සඳහා අඩු ආදායම්ලාභී පාසල් දරුවන් හට ගරු මන්ත්‍රී කොට්ඨාස 25ම ආවරණය වන පරිදි අභ්‍යාස පොත් ආධාරයෙන් ප්‍රදානය පිළිබඳ සාකච්ඡා කල අතර ගෝලීය කොවිඩ්-19 වසංගත තත්ත්වය තවමත් පහවගොස් නැති හෙයින් සහ සාමාන්‍ය පරිදි පාසල් ආරම්භ වී නොමැති හෙයින් අභ්‍යාස පොත් අයදුම්පත්‍ර සඳහා දරුවා ඉගෙනුම ලබන පාසල් වල විදුහල්පතිවරුන්ගේ නිර්දේශ ලබා ගැනීමට ඇති අපහසුව ගරු මන්ත්‍රීවරුන් පෙන්වා දෙන ලදී. ඒ අනුව සියළුම දෙනා ඒකමතිකව පහත තීරණයන් සඳහා එළඹිණි.

| |
|---|
| තීරණ අංක 25<br><br>පාසල් දරුවන්ගේ ආධාර අයදුම්පත්‍ර සඳහා හැකි අවස්ථාවලදී පමණක් විදුහල්පති නිරේදේශය ලබා ගැනිමටත්, අපහසු අවස්ථා වලදී ග්‍රාම නිලධාරී නිර්දේශය ලබා ගැනීම මත පමණක් අයදුම්පත්‍ර භාර ගැනීමටත්, පෙර වසර වලදී ග්‍රාම නිලධාරී අත්සන පමණක් ඇති අයදුම්පත්‍ර සම්බන්ධයෙන් ගැටළු ඇති වූ බැවින් ග්‍රාම නිලධාරී සිය අත්සන යොදනුයේ ආධාර ඉල්ලුම්කාර දරුවා අභ්‍යාස පොත් ලබා ගැනීමට සුදුසු වන දරුවෙක් වන බැවින් එවැනි අයදුම් පත්‍රද පිළිගැනීමට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. |
| තීරණ අංක 26<br><br>බහුතර මන්ත්‍රීවරුන් ප්‍රා/ය විසින් රු.200,000කට ආසන්න වටිනාකමට සකසන ලද තොරතුරු මත පදනම්ව පොත් කට්ටල අයදුම් කිරීමටත් එයට කැමැත්ත නොදක්වන මන්ත්‍රීවරුන් තම අවශ්‍යතාවය මත උපරිම රු.200,000ක වටිනාකමෙහි පිහිටා අභ්‍යාස පොත් ඇණවුම් ලේඛණ සකසා දීමට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. |

| |
|---|
| තීරණ අංක 27<br>පොත් ප්‍රදානය කිරීමේ කටයුතු සමස්ථ බල ප්‍රදේශයේ කොට්ඨාස 25ම ආවරණය වන පරිදි සිදු කිරීමට ගරු මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. |

ix.ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් ගරු මහා සභාවට යෝජනා කීපයක්ම ඉදිරිපත් කල බවත් ඒවා කමිටු වලට යොමු කිරීම වඩාත් සුදුසු බැවින් ගරු සභාපතිතුමා ඒවා කමිටු සඳහා යොමු කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. ඒවා සම්බන්ධයෙන් ද කුඩා මතක් කිරීමක් කල යුතු බවත් එම වැඩ කටයුතු ඉතාමත් ඉක්මනින් කරගත යුතු බවත් මින් පෙර සඳහන් කල මාර්ගය සඳහාද ඉක්මනින් සුදුසු පියවර ගන්නා ලෙසද ඉල්ලා සිටින ලදී.ගල්වක,ජංකුරාවෙල ග්‍රාම නිලධාරී වසමේ අඹරව්විමුල්ල ප්‍රදේශය පසුගිය ගංවතුරට විශාල ලෙස යටවූ බවත් එක් කොටසක් දූව ප්‍රදේශයක් බවත් වැසි කාලයේදීඑක් නිවසක් සම්පූර්ණයෙන්ම කඩාගෙන ගිය බවද අක්කර ගණනාවක් මාඔයට කඩාගෙන ගිය බවද ප්‍රකාශ කරන ලදී. එහි මැදින් අප සභාවට අයත් මාර්ගයක් තිබෙන බවත්, පවුල් 20 පමණ එහි ජීවත් වන බවත් තමන් සිතනා පරිදි ඉදිරියේදී එම කොටසද මා ඔයට ගසාගෙන යාමට ඉඩ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එවිට මේ සියල්ලටම බැනුම් ඇසීමට සිදු වනුයේ අප සභාවට බවත්යම් විනාශයක් සිදු වුවහොත් එක් පවුලක් හෝ එලෙස ගසාගෙන ගියහොත් එය සමස්ථ දේශපාලන බලය හොබවන සියළුම දෙනාට ගැටළුවක් බවත් වශේෂයෙන් අවධානය යොමු කර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසද ඉල්ලා සිටින ලදී. මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබාදෙන ලෙසත් මේ වන විට තමන් මෙන්ම ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතාද තම කොට්ඨාසයේ සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය අධික වර්ෂාවත් සමඟ ග්‍රාම නිලධාරී වසම් 04ක් තමන්ද ඇතුළුව ගං වතුරට යටවූ බවත්, එහිදී ගරු සභාපතිතුමා ප්‍රමුඛ සියළු දෙනාගේම දායකත්වයෙන් විශාල වැඩ කොටසක් අප සභාව විසින් සිදු කල බවත්, ජලයෙන් යටවූ අවස්ථාවේ ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා, ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා, ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විශාල ලෙස සහයෝගය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. දික්වෙල වසමට පානීය ජලය දින තුනක් පමණ අඛණ්ඩව ලබා දුන් බවත්, වැසිකිළි පිරිසිදු කර ගැනීමටද ළිං ඉහන කටයුත්තද ගරු සභාපතිතුමාව දැනුවත් කර යම් දැ නොමිලයේ කර ගත් බවත්, මේ සියල්ල වෙනුවෙන්ම ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

එම ප්‍රදේශයේ තාර දමා කොන්ක්‍රීට් කර නොමැති මාර්ග විශාල සංඛ්‍යාවක් තිබෙන බවත්, ඒවාහි ගමන් කිරීමට නොහැකි තරමට වලවල් සෑදී ඇති බවත්, ඇටියාවල මාර්ගය තිරුවානා දමා මෝටර් ග්‍රේඩරයෙන් සකස් කර ගත් බවත්, දින 5ක් 6ක් තම කොට්ඨාසයට යන්ත්‍රෝපකරණ ඒකකය දෙසැම්බර් මස 31 වන දිනට පෙර ප්‍රථම ලබාදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.මේවා හැකි ඉක්මනින් සොයා බලා කටයුතු කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

2021 අයවැය යටතේ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කර්මාන්ත කමිටු අනුමත කල වැඩ විෂයන් සඳහා බඩු ඇද මාස ගණනාවක් ගත වන බවත් යන්ත්‍රෝපකරණ, සේවකයින් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් එම කටයුතුද හැකි ඉක්මනින් ඉටු කරදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී. අයවැය ප්‍රතිපාදන යටතේ කිසිදු ව්‍යාපෘතියක් කර ගැනීමට නොහැකි වී ඇති බවත් එය සම්බන්ධයෙන් ද විශේෂ අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී. තම උපන්දිනයට සුභ පැතුම් එක් කල සියළු දෙනාටද ස්තූතිය පුද කරන ලදී. සහයෝගය ලබා දුන් සියළුම දෙනාටද තම ස්තූතිය පුද කරන ලදී.

x. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව වෙන්නප්පුව තරම් විදේශ විනිමය පැමිණෙන ගමක් වෙන කොහේවත් නොමැති බවත්, එම පැමිණෙන විදේශ විනිමයට වෙන්නප්පුව ඇතුල් වන සිද්ධි දාමය පිළිබඳව ගරු සභාපතිතුමා දැනුවත්දැයි විමසා සිටින ලදී. තමන් මහරජයට ද ලිපියක් ලියූ බවත් විදේශ මුදල් රැගෙන පැමිණි පසුව ඒවා නිතරම විවිධ ස්ථාන වලින් මාරු කරන බවත් එවිට බැංකුවට වඩා වැඩි මුදලක් එම ආයතන වලින් ගෙවන බවත් ප්‍රකාශ කරන ලදී. එම ආයතන හරහා නැවත එම විදේශ මුදල් රට වලට යන බවත් ඒවා අප රටේ රඳවා ගැනීමට ක්‍රමයක් සාදා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එමඟින් සුළු මුදලක් රජයට ලබා දෙන බවත්, එම නිසා අප රටේ ඩොලර් හිඟ වී ඇති බවත් ඉතාලියටද මෙලෙස පාපාන්දු ක්‍රීඩකයින්ට වියදම් කර එසේ එම රට පත් වූ බවත් එහිදී එකල සිටි අගමැති ඒ සඳහා පියවර ගෙන එම තත්ත්වය වලක්වා ගත් බවත් නමුත් ලංකාවේ අද වන තෙක් ඒ සඳහා ක්‍රියාමාර්ග නොගත් බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව වැඩිම යූරෝ පරිහරණයක් වන බැවින් ගරු සභාපතිතුමාටද මේ සඳහා වගකීමක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම පවසන කතාව සත්‍ය බවත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බවත් මේ වන විටද ඒ සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

xi. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව වසර 04ක් සභාවේ සිට අද දින ළමා හා කාන්තා කටයුතු පිළිබඳව කතා කල බවත්, කාන්තාවන් සම්බන්ධයෙන් කතා කලහොත් අවස්ථා කීපයක් පසු කරමින් පැමිණෙන බවත්, කාන්තාව සුවිශේෂී වන්නේද එම නිසාම බවත් ප්‍රකාශ කරන ලදී. අප සභාව තුළ කාන්තාවන්ට හා දරුවන්ට උසස් ස්ථානයක් ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වන බවද ප්‍රකාශ කරන ලදී. උත්තරීතර පාර්ලිමේන්තුවට යැවූ උගත් බුද්ධිමතුන් කාන්තාවන් සම්බන්ධව හැසිරෙන ආකාරය දුටු විට අප අද දින කල මෙම කටයුත්ත ඒ සඳහා පහරක් එල්ල කිරීම බවත්, මෙය අපහාසයක් නොවන බවත් ආදර්ශයක් බවත් මෙම කටයුත්ත ආදර්ශමත්ව සිදු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වන බවත් ප්‍රකාශ කරමින් තම කතාව අවසන් කරන ලදී.

xii 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා අයවැයට ඇතුළත් කර නොමැති සංවර්ධන වැඩ කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 28

2021 වර්ෂයේ සංවර්ධන යෝජනා සඳහා අයවැයට ඇතුළත් කර නොමැති පහත සංවර්ධන වැඩ කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| අ/අ | ගරු මන්ත්‍රීතුමාගේ/ ගරු මන්ත්‍රීතුමියගේ නම | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා | වයික්කාල මත්ස්‍ය වෙළඳසැල ප්‍රතිසංස්කරණය කිරීම | 295,697.15 |
| 2. | | ද/වයික්කාල ශා.සේවියර් දේවස්ථානය වම්පස අතුරු මාර්ගය ප්‍රිමික්ස් කිරීම | 441,000.00 |
| 3. | | උ/වයික්කාල රාජ් ප්‍රනාන්දු මහතාගේ නිවස පාර ප්‍රිමික්ස් කිරීම | 248,000.00 |
| 4. | | බෝලාන සමගි මාවතේ නෝමන් මහතාගේ නිවස අසල පාර ප්‍රිමික්ස් කිරීම | 270,000.00 |
| 5. | ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා | අංගම්පිටිය සපත්තු බෝක්කුව ඉදි කිරීම | 106,000.00 |
| 6. | ගරු මන්ත්‍රිනි ආර්.නිරෝශා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය | මිරිසන්කොටුව රනිල් මහතාගේ නිවස අසල මාර්ගය ඉතිරි කොටස සිදු කිරීම | 122,000.00 |
| 7. | ගරු මන්ත්‍රී ඒල්.කේ.ජගත් ප්‍රියංකර මහතා | දික්වෙල මැ ගොඩැල්ල පාර 04වන පටුමඟ ප්‍රිමික්ස් කිරීම | 165,000.00 |
| 8. | ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා | ද/දූම්මලදෙණිය පල්ලිය අසල මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම | |
| 9. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා | ද/වෙන්නප්පුව ශාන්ත ජුසේවාස් කුරුස තොටුපල දේවස්ථානයේ විදුලි පලක ස්ථානය සංවර්ධනය කිරීම | 422,741.92 |
| 10. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා | තුලාවල කොහිලමෝල පාර අතුරු පාර සංවර්ධනය කිරීම | 594,691.98 |
| 11. | | නැ/කිරිමැටියාන තුලාවල පාර අජිත් මහතාගේ නිවස අසල පාර ප්‍රිමික්ස් කිරීම | 594,691.98 |
| 12. | | බෝතලේගම ග්‍රාමෝදය මාර්ගය පැති කාණුව ඉදි කිරීම | 1,075,000.00 |
| 13. | ගරු මන්ත්‍රිනි ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය | මැ/ උල්හිටියාව වෛද්‍ය තිලක් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය තාර දැමීම | 198,101.55 |
| 14. | | උල්හිටියාව අරුමයිනායගම් මාවත වමට ඇති පළමු අතුරු | 538,380.00 |

| | | | |
|---|---|---|---|
| | | මාර්ගය තාර දැමීම | |
| 15. | ගරු මන්ත්‍රී.ඒ්.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා | බණ්ඩිරිප්පුව වැව පාර ජෝජ් මහතාගේ නිවස අසල පාර සංවර්ධනය කිරීම | 404,907.48 |
| 16. | ගරු මන්ත්‍රීනි අයි.එච්.නයෝමි රම්යලතා මහත්මිය | කහටවිල - ලූකස්වත්ත ජනපදය ප්‍රජා ශාලාව ඉදි කිරිම (2 අදියර) | 220,000.00 |
| 17. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ්.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා | වෙල්ලමංකරය ජෙරනෝමියුස් මාවත ප්‍රිමික්ස් කිරීම | 482,227.13 |
| 18. | ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා | දංකොටුව සතිපොලේ වහලය අළුත්වැඩියා කිරීම | 40,334.42 |
| 19. | ගරු මන්ත්‍රී ඒච්.ඒ.ක්ලිටස් පෝල් පෙරේරා මහතා | ගෝනාවිල පතිරගම මාවත දෙවන හරස් මාර්ගය කොන්ක්‍රීට් ඇතිරීම | 1,198,364.06 |
| 20. | - | දංකොටුව උපකාර්යාලය අළුත්වැඩියා කිරීම | 56,231.00 |
| 21. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා | බ/අංගම්පිටිය කන්ඩක්කුවත්ත මාර්ගය දෙවනවර තාර දමා සංවර්ධනය කිරීම | 174,121.90 |
| 22. | | බ/අංගම්පිටිය අඹගහවත්ත ජනපදයේ සුරුවම අසල සිට ඉදිරියට ඇති මාර්ගය දෙවන වර තාර දමා සංවර්ධනය කිරීම | 197,507.83 |

xiii..නිවේදන යටතේ සඳහන් කල වයික්කාල ශා.සේවියර් දෙව්මැදුරේ මාර්ගය සකස් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියක් ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 29 |

ජනවාරි මස සිට රීති මාලාව සමඟ කටයුතු කරන බවත්, සෑම දිනකම මහා සභාවේදී ඒ සඳහා විශේෂ වැඩ කටයුත්තක් ආරම්භ කරන බවත් ප්‍රකාශ කරමින් න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.